ස්වාධීන වෘත්තිය සමිති සහ බහුජන සංවිධාන එකතුව
Alliance of Independent Trade Unions and Mass Organizations
சுயாதீன தொழிற்சங்கங்கள் மற்றும் வெகுசன அமைப்புக்களின் ஒன்றியம்
#20, Temple Road, Colombo 10, Sri Lanka.I 077 3712989 I 071 345 7338 I independenttradunionsandmasso@gmail.com

ආරාධනයයි

ප්‍රිය සහෝදරිය/ සහෝදරයා

මහත්මියනි/ මහත්මයාණෙනි,

PSTA සහ POCA පනත් කෙටුම්පත්වලට සංශෝධන පැලැස්තර එපා !
මුළුමනින්ම හකුළා ගන්නා තුරු සටන් වදිමු !

වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම්වලට සහ ප්‍රජාතන්ත්‍රවාදී නිදහසට බරපතළ තර්ජනයක් එල්ල කරන රාජ්‍යය ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත (PSTA) සහ සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත (POCA) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට එරෙහිව ස්වාධීන වෘත්තීය සමිති සහ බහුජන සංවිධාන එකතුව ලෙස අපි අඛණ්ඩව විරෝධය පළ කළෙමු.

එමෙන්ම, දැනට ක්‍රියාත්මක වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) ඇතුළු මර්දනකාරී නීති අහෝසි කරන ලෙස ද අපි රජයට බලපෑම් කළෙමු.

අප ඇතුළු විවිධ පාර්ශ්වයන් විසින් ගෙන ගිය විරෝධතා සහ බලපෑම් හමුවේ රජයේ ස්ථාවරයේ යම් වෙනසක් සිදුවී ඇති බව පෙනෙන්නට තිබේ. ජනාධිපතිවරයා විසින් ද මෙම පනත් කෙටුම්පත් මහජන සාකච්ඡාවට යොමු කර, යම් සංශෝධන සහිතව නැවත ඉදිරිපත් කරන බව ප්‍රකාශ කර ඇත.

කෙසේ වෙතත්, **අපගේ විරෝධයේ පදනම පවතින්නේ මෙම පනත් කෙටුම්පත්වල ඇතැම් වගන්තිවල පමණක් නොව, ඒවායේ සමස්ත අන්තර්ගතය සහ ක්‍රියාත්මක කිරීම තුළින් ඇතිවිය හැකි මර්දනකාරී බලපෑම තුළය.**

ඒ අනුව, අපගේ මූලික විරෝධයට හේතු වූ කරුණු කිහිපයක් මෙසේය.

1. **ත්‍රස්තවාදය පිළිබඳ පුළුල් හා අපැහැදිලි අර්ථකථනයක් ඉදිරිපත් කිරීම** එමඟින් සාමාන්‍ය වෘත්තීය සමිති ක්‍රියාමාර්ග, කම්කරු අරගල සහ මහජන උද්ඝෝෂණ පවා ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ලෙස අර්ථකථනය කිරීමට අවකාශ සැලසීම.

2. **අධිකරණ බලතල විධායකය වෙත පවරා ගැනීම** අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම ඇතුළු පුද්ගල නිදහසට හා අධිකරණයේ ස්වාධීනත්වයට අදාළ තීරණ සම්බන්ධයෙන් විධායකයට අසීමිත බලතල හිමිවීමේ අවදානම.

3. **සිවිල් කටයුතු සඳහා ආරක්ෂක හමුදාවන්ට බලතල පැවරීම** හමුදාව සහ වෙරළ ආරක්ෂක හමුදාව වෙත පොලිස් බලතල ඇතුළු සිවිල් නීතිය ක්‍රියාත්මක කිරීමේ බලතල ලබාදීම හරහා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහය හා බලතල බෙදීම දුර්වල කිරීම.

4. **මර්දනකාරී බලතල එකිනෙක සම්බන්ධ කිරීම** මෙම පනත්වල විවිධ වගන්ති එකිනෙකට සම්බන්ධව ක්‍රියාත්මක වීමෙන්, අවශ්‍ය ඕනෑම අවස්ථාවක වෘත්තීය සමිති ක්‍රියාකාරකම් සහ මහජන අරගල ත්‍රස්තවාදය හෝ සංවිධානාත්මක අපරාධ ලෙස නම් කර මර්දනය කිරීමට අවකාශ නිර්මාණය වීම.

මෙම කරුණු සැලකිල්ලට ගැනීමේදී, පනත් කෙටුම්පත්වල වගන්ති කිහිපයක් සංශෝධනය කිරීමෙන් පමණක් අප මතු කරන මූලික ගැටලුව විසඳෙන්නේ නැත. සංශෝධන සහිතව හෝ මෙම පනත් නැවත ඉදිරිපත් කිරීම, වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම්, වෘත්තීය සමිති නිදහස සහ මහජන අරගල මර්දනය කිරීමට භාවිත කළ හැකි නීතිමය පසුබිමක් තවදුරටත් පවත්වාගෙන යාමක් ලෙස අපි දකිමු.

එසේම, රට තුළ යුදමය තත්ත්වයක් හෝ නිශ්චිත ත්‍රස්තවාදී තර්ජනයක් නොමැති පසුබිමකත්, ත්‍රස්තවාදය සහ සංවිධානාත්මක අපරාධ මැඩලීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන දැනටමත් පවතින තත්ත්වයකත්, මෙවැනි පුළුල් මර්දනකාරී බලතල සහිත නව නීති හඳුන්වාදීමේ අවශ්‍යතාවක් අපි නොදකිමු.

මෙම තත්වයට මුහුණ දීම සහ මෙම අණපනත් හකුලා ගැනීමට බල කිරීම සඳහා ස්වාධීන වෘත්තිය සමිති, බහුජන සංවිධාන මෙන්ම මහජනතාවගෙන් සැදුම්ලත් වඩා පුළුල් මහජන පෙරමුණක අවශ්‍යතාවය වෙන කවරදාකටත් වඩා මතු වී ඇත. මේ සම්බන්ධව කතිකාවක් ගොඩනැගීම සඳහා සාකච්ඡා සභාවක් වෙනුවෙන් ඔබගේ වෘත්තීය සමිතියට, සංවිධානයට, ඔබට සහෝදරත්වයෙන් ආරාධනා කර සිටිමු.

ස්ථානය - **කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරය**
දිනය - **2026 නොවැම්බර් 16 (සඳුදා)**
වේලාව - **සවස 03.00**

ස්වාධීන වෘත්තීය සමිති සහ බහුජන සංවිධාන එකතුව

අනූප නන්දුල
ජ්‍යේෂ්ඨ උප සභාපති
ලංකා බැංකු සේවක සංගමය

ජෝශප් ස්ටාලින්
ප්‍රධාන ලේකම්
ලංකා ගුරු සංගමය

චතුර සමරසිංහ
ප්‍රධාන ලේකම්
ලංකා වතු සේවා සංගමය

ඇන්ටන් මාකස්
සම ලේකම්
නිදහස් වෙළඳ කලාප හා
පොදු සේවා සේවක සංගමය

එස් අමරසිංහ
ලේකම්
වාණිජ හා කාර්මික සේවක සංගමය